සාමාන්‍ය නියමයන් හා කොන්දේසි

1. සී/ස බෑන්ක් ඔෆ් චයිනා තම කොළඹ පිහිටි ශාඛාවේ දී (BOCC) ව්‍යාපාර ගිණුමක් විවෘත කරගත හැකි අතර එම ගිණුම ඉතිරි කිරීම්, ජංගම හා කාල තැන්පත් ගිණුමක් වියහැකි වුවද එවන් ගිණුම්වලට පමණක් සීමානොවේ. (මෙවැනි ගිණුම් සාමූහිකව ''ගිණුම/ම්'' ලෙස හඳුන්වන අතර) එකී ගිණුම් සිමා සහිත සමාගම් හෝ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතන/සංවිධාන නමින් විවෘත කළහැකි සේම (එවන් සංස්ථා මින්මතු ''සේවාදායක'' ''සේවාදායකයන්'' ලෙස හඳුන්වන අතර) එම සේවාදායකයන්ට බැංකුව විසින් සේවා සපයනු ලබයි. (සාමූහික ලෙස බැංකු සේවා) ගිණුම් විවෘත කිරීමෙනුත්, අදාළ බැංකු සේවා ලබාගැනීමෙනුත් සේවාදායක විසින් මෙම නියමයන් හා කොන්දේසිවලට එකඟවන අතර වෙනත් විශේෂිත කොන්දේසි වලට සේවා සඳහා එකඟවේ.

2. සෑම ගිණුමකටම අංකයක් දෙනු ලබන අතර සේවාදායක විසින් සෑම බැංකු ගනුදෙනුවක දී මෙන්ම හා ආපසු ගැනීම් තැන්පතු පත්‍රයකට අදාළ අංකය සඳහන් කළ යුතුය.

3. සේවාදායක BOCC වෙත එහි අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලක සභාව විසින් ඔවුන්ගේ යෝජනාව පරිදි බලාත්මක කරඇති අත්සන්කරුවන්ගේ ආදර්ශ අත්සන් සැපයීමට බැඳී සිටින අතර සේවාදායක විසින් එසේ ලබාදී ඇති බලතල සාමාන්‍ය හෝ සීමා සහිත ද යන වග දැන්විය යුතු අතර එය සීමා සහිත වුවහොත් එවැනි සීමාවන්ගේ ප්‍රමාණය ද දැන්වීමට ද සේවාදායක බැඳීසිටී. එසේ බලාත්මක කරනු ලබන ලේඛනයේ අත්සන්කරුවන්ගේ සීමාවන් සඳහන් නොකෙරෙන විට සේවාදායක එවැනි ආදර්ශ අත්සන සම්බන්ධව ලබාදී ඇති අතර මුදල් ප්‍රමාණයන් මෙන්ම සංස්ථාවේ සමාගම් ව්‍යවස්ථාවන්ට අනුව හෝ සංස්ථාවේ රෙගුලාසීන්ට අනුව ලබා දී ඇති ඇටර්නි බලතල හෝ වෙනත් ලේඛනයක එකී බලතල සාමාන්‍ය හෝ සීමා සහිත බවද BOCC වෙත දැන්විය යුතුවේ. සේවාදායකයන් එසේ බැඳීමට ලක්කළ හැකි පුද්ගලයන්ගේ යම් වෙනසක් හෝ ඔවුන්ගේ බලතල හි වෙනසක් සිදු වූ විට ද එම තොරතුරු ඉහත කී ලේඛනවල සඳහන් වුවහොත් පමණක් BOCC විසින් පිළිගනු ඇත. සේවාදායක විසින් තම නොසැලකිල්ල හේතුවෙන් අදාළ ආදර්ශ අත්සන් සඳහන් කරඇති ආකාරයට සැපයීමට අපොහොසත් වුවහොත් හෝ ලබාදී ඇති ආදර්ශ අසම්පූර්ණ හෝ වැරදි සහගත වූ විටකදි එමඟින් සේවාදායකට සිදුවිය හැකි අලාභ හා පාඩු පිළිබඳව BOCC විසින් වගකීම භාර නොගනේ.

4. කිසියම් හෝ අවස්ථාවක සේවාදායක විසින් BOCC වෙත තමන්ගෙන් සිදුවිය යුතු බැඳීම් ඉටු නොකළහොත්, බැංකුවට ඔවුන්ගේ ක්‍රියාත්මකවීමේ අයිතියට අමතරව නීතියට අනුකූලව සේවාදායකගේ ඇප/සුරැකුම් කොටසක් හෝ සම්පූර්ණයෙන් විකුණා මුදල් බවට පරිවර්තනය කිරීමට බැංකුවට සිදුවනු ඇත. මෙවැනි අවස්ථාවක සේවාදායකට පෙර දැනුම්දීමක් හෝ කැඳවුම් නියෝගයක් නිකුත් කිරීමකින් තොරව BOCC වෙත අයවිය යුතු සියළු මුදල්, එසේ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් තමන්ට හිඟව ඇති මුදල් උපදානය කරගැනීමට හැකි අතර මෙය බැංකුවට අයවිය යුතු පොලියට මෙන්ම අනෙකුත් ගාස්තුවලට ද එක සේ බලපානු ඇත.

5. BOCC හිමිව ඇති සාමාන්‍ය කැපබලය හෝ වෙනත් අයිතීන් හෝ ප්‍රතිකර්මයන්ට අමතරව, BOCC විසින් නීතිමය වශයෙන් හෝ මෙහෙයුම් භාවිතයෙන් හෝ එසේ නොමැතිව සේවාදායකයාට දැන්වීමකින් තොරව සේවාදයකගේ ගිණුම් ඒකාබද්ධ කිරීමේ හා/හෝ සම්බන්ධ කර බැංකුවට ණයව ඇති නොගෙවූ බැරකම් ලබාගැනීමට ද BOCC ට අයිතියක් ඇති අතර මෙසේ බැරකම් පියවා ගැනීමේ දී වෙනත් ගනුදෙනු මෙන්ම සත්‍ය හෝ අවිනිශ්චිත, ප්‍රාථමික හෝ සමපාර්ශ්වික හෝ පවුල් හෝ වෙන් වෙන් වශයෙන් ඇති බැරකම් ද ඇතුළත් වනු ඇත.

6. කාල තැන්පතුවලින් මුදල් ලබාගත හැකි වන්නේ, එම තැන්පතු කල්පිරීමෙන් පසු පමණි. කාල තැන්පතු කල්පිරීම් උත්පාදන මුදල් ලබාගැනීම සඳහා කල්පිරීම් දිනයේ සිට පැමිණෙන ඊළඟ වැඩකරන දිනයේ දී වන අතර එසේ කරනු ලබන්නේ තැන්පතුවේ ඇති මුදල් නැවත ආයෝජනය කිරීම සඳහා උපදෙස් ලබාදී නොමැති නම් පමණි. එසේ වූවද, නියමිත ලෙස සේවාදායකගේ බලාත්මක කරන ලද ලිඛිත ඉල්ලීමක් තිබේ නම් (බැංකුවට ලබා දී ඇති ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයට අනුව) බැංකුව විසින් තමන්ගේ තනි අභිමතයට අනුව කල්පිරීමට පෙර කාල තැන්පතු මුදාහැරීම සිදුකළ හැකිය. එසේ කල්පිරීමට පෙර මුදාහරිනු ලබන කාල තැන්පතු වෙනුවෙන් බැංකුවේ අභිමතයට අනුව BOCC හි අය ක්‍රමයට අනුකූලව දඩ මුදලක් අය කරනු ඇත.

7. ප්‍රතිවිරුද්ධ වූ විශේෂිත උපදෙස් නොමැති විට කාල තැන්පතු කල්පිරීමේ දී සමාන කාලයක් සඳහා පවත්වා පොලි අනුපාතයක් ද සමඟ නැවත ආරම්භ කරනු ඇත.

8. ජංගම ගිණුමක් නම් ගිණුමේ පවත්නා බැර ශේෂයට පොලි ගෙවීමක් කරනු නොලැබේ.

9. ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුමක් වූ විට මෙම ගිණුම් සඳහා ගෙවනු ලබන පොලි අනුපාත බැංකුව විසින් බැංකු ශාඛා කාර්යාලයේ දී හා/හෝ බැංකුවේ නිල වෙබ් අඩෙවියෙන් ප්‍රදර්ශනය කරනු ඇත.

10. පවත්නා කාල තැන්පතු සඳහා කල් පිරෙන තෙක් පොලි අනුපාත වෙනස් නොවන අතර අනෙක් තැන්පතු සඳහා ගෙවනු ලබන පොලි අනුපාතය දැන්වීමකින් තොරව වෙනස්වීමට ඉඩකඩ ඇත.

11. BOCC විසින් පවත්නා ණය ඇතුල් කිරීම් සඳහා බලපෑම් කිරීමට ඉඩකඩ ඇති වූවද සේවාදායකගෙන් හෝ/ඔවුන් වෙනුවෙන් ප්‍රතියෝජන අගයන් ලබා දී එම ඇතුල් කිරීම්වලට එරෙහිව නියමිත කාලය තුළ ගෙවීම් කළ යුත්තේ වුවද, එහි පැහැර හැරීමක් සිදු වී ඇති විටෙක අදාළ ණය ඇතුල් කිරීම මුළුමනින්ම හෝ අඩක් වශයෙන් දැන්වීමකින් තොරව අවලංගු කිරීමට බැංකුවට හිමිකම් ඇත.

12. සේවාදායකගේ BOCC ගිණුමකින් චෙක්පත් මඟින් මුදල් ලබාගැනීමේ දී පහත සඳහන් රෙගුලාසි මඟින් එකී ක්‍රියාදාමය පාලනය කෙරෙනු ඇත.

a. සේවාදායක විසින් BOCC මඟින් තමන්ට ලබා දී ඇති චෙක්පොත ආරක්ෂා සහිතව තබාගත යුතු අතර චෙක්පොත හෝ චෙක්පත් නැති වී ඇතැයි සේවාදායක විසින් දැනගත් විගස ඒ සම්බන්ධව ලිඛිතව බැංකුව දැනුවත් කළ යුතුය. එමෙන්ම සේවාදායක විසින් ගෙවීම් නැවැත්වීමට ක්ෂණිකව උපදෙස් ලබාදිය යුතු අතර එකී උපදෙස් අතරට චෙක් අංකය, දිනය, මුදල් ප්‍රමාණය මෙන්ම ආදායකගේ නම ද ඊට ඇතුළත් විය යුතුය. එවැනි උපදෙස් ක්‍රියාවට නංවිය හැකි වනුයේ එසේ ලිඛිත උපදෙස් ලැබුණ අවස්ථාවන වන විට අදාළ චෙක්පතට ගෙවීම් සිදුකළ නොමැති නම් පමණි. එමෙන්ම ගෙවීම් නැවැත්වීම සඳහා වූ උපදෙස් සාධාරණ කාලයක් තුළ BOCC වෙත ලිඛිතව තහවුරු කළයුතු වේ. BOCC විසින් නැතිවූ, සොරාගත්, නීතිවිරෝධීව භාවිතා කළ, වංචනිකව වෙනස්කළ හෝ කුඨ ලෙස සකස් කළ චෙක්පත් සඳහා ඉහත සඳහන් දැන්වීම ලැබීමට පෙර මෙන්ම ඒ සඳහා කටයුතු කිරීම සාධාරණ කාලයක් තිබිය දී ගෙවීම් සිදුකර ඇති විටක දී, එසේ ගෙවා ඇති මුදල සේවාදායකගේ ගිණුමට හරකිරීමට BOCC වෙත හිමිකම් ඇත.

b. සේවාදායක විසින් අසත්‍ය කරුණු ඇතුළත් කිරීම වැළැක්වීමට තමන්ගේ චෙක්පත් නිකුත් කිරීමට පෙර එම චෙක්පත් සම්පූර්ණයෙන් පිරවිය යුතුය. චෙක්පත් නිකුත් කරන මුදල් ප්‍රමාණය වචන වලින් මෙන්ම සංඛ්‍යා වලින් ද ලිවිය යුතු අතර අදාළ මුදල් ප්‍රමාණය වෙනස් කිරීමට හැකි ඉඩකඩ අවමකර හැකි ආකාරයට එය ලිවිය යුතු වේ.

c. සේවාදායකට තම චෙක්පත් තවදුරටත් අවශ්‍ය නොවන විට මෙන්ම එම ගිණුම් වසා දැමූ විගස චෙක්පොත BOCC වෙත ආපසු භාරදීමට සේවාදායක බැඳී සිටී.

d. සේවාදායක ගිණුම්වලට බැර කරන චෙක්පත් සඳහා පමණක් වන අතර අදාළ මුදල් ලබාගත හැකි වන්නේ අණලත් බැංකුව විසින් එම චෙක්පත නිශ්කාශනය වීමෙන් පසුවයි.

e. සේවාදායකයන් ඔවුන්ගේ ගිණුම් අයිරා කර නොගත යුතු අතර BOCC සමඟ පෙර ගිවිසගත් ආකාරයට අයිරා සීමාව නොඉක්මවයි. මේ අනුව තම ගිණුමේ සෑහෙන මුදල් ප්‍රමාණයක් නොමැති විට BOCC වෙත ලැබෙන චෙක්පත් අගරු කිරීමට BOCC වෙත අයිතියක් ඇති අතර එසේ අගරු වන සෑම චෙක්පත් සඳහා ගාස්තුවක් අයකෙරෙනු ඇත. එවැනි අවස්ථාවන් හි සේවාදායකයින් විසින් අයිරා වූ ප්‍රමාණයත්, පොලිය ද බැංකු ගාස්තු ඇතුළුව ක්ෂණිකයේ ගෙවීමට කොන්දේසි විරහිතව සේවාදායකයා බැඳී සිටී. මෙවැනි පොලියට හා බැංකු ගාස්තු සේවාදායකගෙන් අයකර ගැනීමට BOCC ට අයිතියක් ඇත. මෙයින් BOCC අයිරා පහසුකම් සැපයීමට බැඳී ඇති ගිවිසුමක් ඇතැයි යන්න අදහස් කිරීමක් හෝ ප්‍රකාශ කිරීමක් ලෙස වටහා නොගත යුතුය.

13. විදේශීය මුදල් ගිණුම් පවත්වන්නන් විසින් අදාළ නීති, රෙගුලාසි, නිර්දේශ මෙන්ම ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතු බවට උපදෙස් දෙන අතර ව්‍යවස්ථා/නියාමක අවශ්‍යතාවන්ගේ කඩකිරීමේ අවධානම නැති කිරීම සඳහා ඉහත සඳහන් කරුණු කාරණාවන්ට අනුකූලව හැමවිටම ක්‍රියාකළ යුතුය.

14. BOCC වෙත ගෙවීමට සිදුවන සේවාදායකගේ ගිණුම් සම්බන්ධ වූ සියළු පොලී මුදල් ගාස්තු, කොමිස් හා වෙනත් බැංකු ගාස්තු හා වියදම් (නීතීඥ ගාස්තු ඇතුළුව) මෙන්ම ගිණුමට අදාළව ඇති අගය එකතු වන බදු (වැට්බදු), දේශය ගොඩනැඟීමේ බදු හා/හෝ වෙනත් බදු BOCC විසින් සේවාදායක ගිණුමට හරකරනු ඇත. මීට අමතරව BOCC ට ගෙවීමට සිදුවන සියළු වියදම්, (උදාහරණ, තැපැල් මුද්දර, දුරකතන, වෙනත් පණිවුඩ ගාස්තු ආදිය) සේවාදායකගෙන් අයකරනු ලැබේ.

15. සේවාදායක විසින් BOCC වෙත ලබා දී ඇති උපදෙස් අනුව විද්‍යුත් තැපැල් ලිපිනයන්ට සේවාදායකගේ ගිණුම සම්බන්ධව සියළු ගනුදෙනු වාර්තාවන් බැංකුව විසින් එවනු ලබන බැංකු ප්‍රකාශනවල සඳහන් කෙරෙනු ඇත.

16. BOCC සමඟ පවත්වාගෙන යනු ලබන ජංගම, ඉතිරි කිරීම් හෝ වෙනත් ඕනෑම ගිණුම්වල මෙහෙයුම් එවනු ලබන බැංකු ප්‍රකාශනවල සඳහන් වේ.

17. ගිණුම් ප්‍රකාශ සැලකිලිමත්ව පරීක්ෂා කළයුතු අතර දක්නට ලැබෙන දෝෂ මෙන්ම අත්හැරීම් ක්ෂණිකව BOCC වෙත දැනුම්දිය යුතුය. එවැනි දෝෂ හා අත්හැරීම් ප්‍රකාශිත දිනයේ සිට දින 14 ක් තුළ බැංකුව වෙත ලිඛිතව නොදැන්වුවහොත් BOCC හා සේවාදායක අතර එම ප්‍රකාශන අවසන් හා තීරණාත්මක ලෙස සැලකේ.

18. ඕනෑම හේතුවක් මත සමාගමක් වන සේවාදායක ව්‍යවස්ථාපිත ආයතනයක් හෝ සංස්ථාවක අධ්‍යක්ෂකවරුන් හෝ ප්‍රධාන නිලධාරීන් අතර ඇති මත භේදයක් BOCC වෙත දැන්වූ විටෙක එකී ආරවුල විසඳන තෙක් ගිණුම් මෙහෙයුම් මුළුමනින්ම නැවතීමට හෝ සීමාකිරීමට බැංකුවට සිදුවන අතර එම ආරවුල විසඳෙන තෙක් බැංකුව විසින් බලපැවැත්වෙන නීතිරීති අනුව කටයුතු කෙරේ.

19. BOCC විසින් අරමුදල් පිළිගනු නොලැබේ. එසේවූවද, විශේෂිත අවස්ථාවන්හි හා BOCC වෙත පූර්ණ අභිමතය මත ප්‍රතිලාභීන් හඳුනාගත හැකි අරමුදල් සඳහා ගිණුම් විවෘත කරනු ඇත.

20. BOCC විසින් තමන්ගේ අභිමතය පරිදි සේවාදායකගේ ධන සම්පත් හා/හෝ අරමුදල් වල මූලාශ්‍ර සම්බන්ධව තොරතුරු හා එම තොරතුරු සත්‍යාපනය කළහැකි ආකාරය BOCC අවශ්‍යවනු ඇත.

21. BOCC විසින් සමාගමක් වෙනුවෙන් ලබාදෙන වන්දී පූර්ණ භාරගනු ලබන්නේ එම වන්දිපූර්ණ ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයේ/අධ්‍යක්ෂ මණ්ඩලය සම්මතයේ ප්‍රකාශිත මෙහෙයුම් උපදෙස් අනුව අත්සන් තබාඇති වුවහොත් පමණි.

22. BOCC ට ඕනෑම අවස්ථාවක තමන්ගේ තනි හා නිදහස් අභිමතය මත හේතුවක් ලබාදීමෙන් තොරව ඕනෑම ගිණුමක් වසා දැමිය හැක. එසේ වූවද, BOCC විසින් ගිණුම වසාදැමීමට පෙර දින 30 ක දැන්වීමක් සේවාදායකට ලබාදෙනු ඇත. එකී දැන්වීම සේවාදායක විසින් ලබා දී ඇති අවසන් ලිපිනයට තැපැල් මඟින් එවනු ඇත. එවන් අවස්ථාවල දී සේවාදායක විසින් තමන් සතුව ඇති භාවිතා නොකළ චෙක්පත් ඉල්ලූවිට ආපසු දිය යුතු වේ.

23. ශූන්‍ය ශේෂ ගිණුම් හෝ මාස හයක (6) ක කාලයක් අක්‍රීයව පවතින ගිණුම් එක් මාසයක ලිඛිත දැන්වීමකින් අනතුරුව වසා දැමීමේ අයිතිය BOCC සතුවේ.

24. BOCC විසින් තම පරිශ්‍රය තුළ මුදල් නොසපයන අතර මුදල් තැන්පතු හා ආපසු ගැනීම් BOCC ගේ බලයලත් සේවා සපයන්නන් හරහා සිදුකර ගත හැකිය. මෙවැනි සේවා සපයන්නන් කලින් කලට හඳුනා ගනු ලබන අතර ඉන්පසු මුදල් එකතු කිරීම් හෝ බෙදාහැරීම් BOCC විසින් විශේෂිත කළ සේවාදායක විසින් තෝරාගෙන ඇති පරිශ්‍රවල සිදුකෙරෙනු ඇත. බැංකුව විසින් තමන්ගේ අභිමතය මත පරිශ්‍ර ලැයිස්තුවට එක් කිරීම හෝ ඉවත් කිරීමට අයිතිය BOCC සතුවේ.

25. සේවාදායක විසින් නම්කර ඇති පරිශ්‍රයන් හි සේවා සපයන්නන් විසින් මුදල් එකතු කිරීමේ හෝ බෙදාැරීමේ පහසුකම් සපයන විට පහත සඳහන් ලෙස සිදු වේ.

I. සේවාදායක විසින් මුදල් එකතු කිරීමේ හෝ බෙදාහැරීමේ පුද්ගලයින් නම්කර ඇති අතර ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයට අනුව ඔවුන්ගේ අත්සන් ලබාදිය යුතු වේ.

II. සේවාදායක වෙත BOCC මඟින් සේවා සපයන්නන්ගේ නම්කර ඇති මුදල් එකතු කිරීමට හෝ බෙදාහැරීමට බලයලත් පුද්ගලයන්ගේ විස්තර මෙන්ම ඔවුන්ගේ අත්සන් ද ලබාදෙනු ඇත.

III. මුදල් එකතු කිරීම හා බෙදාහැරීම නම් කළ පරිශ්‍රයන්හි පමණක් සිදුකළ හැකිය.

IV. මුදල් එකතු කිරීම හා බෙදාහැරීම විවෘත කරඇති ගිණුම් ආකාරයට සිදුවන අතර මුදල් ගණන් කිරීම සේවාදායක විසින් නම් කරන පරිශ්‍රයන්හි සිදුකරනු ඇත.

V. සේවාදායකගෙන් මුදල් එකතු කරගන්නා විට ඔහු විසින් බැංකු තැන්පතු පත්‍රයක් පුරවා සේවා සපයන්නාට භාරදිය යුතුය.

VI. සේවාදායක වෙත මුදල් ලබාදෙන විට ඔහු විසින් බැංකු ආපසු ගැනීම් පත්‍රයක් පුරවා එහි පරිලෝකනය (ස්කෑන්) කරන ලද පිටපතක් බැංකුවේ නම්කළ ඊමේල් ලිපිනයට ඊමේල් කර එහි මුල් පිටපත සේවා සපයන්නා වෙත දිය යුතුය.

VII. සේවාදායකට මුදල් භාරදීමක් අවශ්‍ය වූ විට, ඔහු විසින් බැංකුව වෙත මුදල් ඇසුරුම් ක්‍රම, මුදල් භාරගැනීමට බලයලත් පුද්ගලයා වැනි තොරතුරු මුදල් භාරදීමට අවම වශයෙන් පැය 24 ක් තුළ දැන්විය යුතුවේ.

VIII. මුදල් භාරදීමට අදාළ උපදෙස් වන වලංගු ස්කෑන්, ඊමේල් හෝ ෆැක්ස් මාර්ගයෙන් වූ ආපසු ගැනීම් උපදෙස් ලද වහාම BOCC විසින් එය සේවාදායකගේ ගිණුමට හරකරනු ඇත. සේවාදායක ගිණුම් බැර කරනු ලබන්නේ බැංකු කාර්යාල වේලාවන් තුළ දී පමණයි.

IX. සේවාදායකගේ නම්කළ පරිශ්‍රයෙන් මුදල් එකතු කරගැනීමට ඔහු විසින් BOCC වෙත උපදෙස් ලබාදීමේ දී සේවාදායක විසින් අවශ්‍ය තොරතුරු එකතු කරගැනීමේ කාලය හා මුදල් භාරදීමට බලයලත් පුද්ගලයාගේ විස්තර මුදල් එකතු කිරීමට බලාපොරොත්තු වන වේලාවල පැය 24 කට කලින් බැංකුවට දැන්විය යුතුය.

X. සේවා සපයන්නා විසින් එකී මුදල් ප්‍රමාණය බවට තහවුරු කිරීමෙන් පසු BOCC විසින් එසේ ලබාගත් මුදල් ප්‍රමාණය සේවාදායකගේ ගිණුමට බැර කරනු ඇත. සේවාදායක ගිණුම් ඇතුල් කිරීම් කරනු ලබන්නේ බැංකු කාර්යාල වේලාවන් තුළ පමණි.

XI. මෙසේ මුදල් එකතු කර ගැනීම් හා බෙදාහැරීම් සම්බන්ධයෙන් ඇතිවිය හැකි මුදල් නැතිවීමේ අවධානම (සේවාදායකගේ පරිශ්‍ර සීමාව තුළ දී) සේවාදායක වෙත පැවරෙනු ඇත. සේවාදායකට තැන්පතු හෝ බෙදාහැරීම් සම්බන්ධ වූ උප පත්‍රයක් (Counterfoil) ලැබී තිබුණ ද හෝ සේවාසපයන්නා විසින් මුදල් භාරගැනීම වෙනුවෙන් නිකුත් කළ ලදුපත සේවාදායක භාරයේ තිබුණද සේවාදායකගේ මෙම වගකීම එක සේ රැඳී තිබෙනු ඇත.

XII. සේවාදායක විසින් සියළු පිරිවැය, ගාස්තු හා වියදම් (නෛතික පිරිවැය හා ගාස්තු ඇතුළුව), අලාභ, වගකීම්, නඩු හෝ වෙනත් දේ ඇතුළුව බැංකුව විඳ දරීමට සිදුවන හෝ මුදල් එකතු කිරීම් හා බෙදාහැරීමේ දී සිදුවිය හැකි කළුසල්ලි ජාවාරම්, බදු නොගෙවීම් හෝ වෙනත් ව්‍යවස්ථාපිත හිඟතාවන් අනීතික ක්‍රියාකාරකම් සම්බන්ධව සිදුවිය හැකි ප්‍රතිවිපාකයන්ට එරෙහිව සේවාදායක විසින් මෙයින් වෙනස්කළ නොහැකිසේ ද කොන්දේසි විරහිතව ද BOCC වන්දි පූර්ණය කරනු ලැබේ.

XIII. සේවා සපයන්නන් හරහා මුදල් එකතු කිරීම් හා බෙදාහැරීම BOCC මඟින් සිදු කිරීමේ දී සේවා සපයන්නන්ට අදාළ වන අත්සන්කරුවන්ගේ ලැයිස්තුවක් ද ලබාදීම ගැන සේවාදායකයා විසින් එකඟවේ.

26. BOCC ට තම බැඳීම් හි කාර්ය සාධන තෙවැනි පාර්ශ්වයට අතුරු කොන්ත්‍රාත් කිරීමට හෝ පැවරීමට හැකිය. එසේ වූවද, BOCC විසින් මෙම කටයුතු ඉටුකිරීමේ වගකීම දැරීමට බැඳී සිටියි.

27. BOCC විසින් තමාවෙත ලබාදෙන ලේඛනවල පිටපත් නියමිත ආකාරයෙන් සහතික කර සත්‍යවත් කිරීමට ද එය BOCC ට අවශ්‍ය ආකාරයෙන් ද සිදුකර යුතු වේ.

28. සේවාදායකගේ තොරතුරුවල යම් වෙනසක් සිදු වූ විගස ඒ බව BOCC වෙත දැන්විය යුතුය. එමෙන්ම සේවාදායක විසින් BOCC වෙත ලබාදෙන සියළු තොරතුරු (ගිණුම් විවෘත කිරීමේ ආකාරය හා වෙනත්) සත්‍ය බවට වගකිව යුතුය. මෙම තොරතුරුවල යම් වෙනසක් සිදුවුවහොත් එය BOCC වෙත එකෙනෙහිදීම දැන්වීමට ද සේවාදායක භාරගනු ලබයි.

29. ඉහත ගිණුම්වෙත බැරකළ යුතු සමහර හෝ සියළු මුදල් ප්‍රමාණයන් පළමුව සේවාදායක ලබා ඇති අයිරාවෙන් පොළී ප්‍රමාණය අඩුකිරීමට යොදා ගැනෙන අතර එම ක්‍රියාදාමයට පොළිය සම්පූර්ණයෙන් ගෙවා දමන තෙක් දිගටම කරගෙන යනුලැබේ. ඉන්පසු පමණක් බැර කෙරෙන මුදල් ප්‍රමාණයන් එහි අයිරාවන් හා වෙනත් පහසුකම් සම්බන්ධයෙන් මූලධනය අඩු කිරීමට යොදාගනු ඇත.

30. සේවාදායක මෙයින් ප්‍රකාශකර එකඟවන්නේ BOCC හි පවත්වාගෙන යන ගිණුම් පනතේ සඳහන් සේ පාලනය වන බවය.

I. BOCC විසින් කලින් කලට ගිවිසගනු ලබන නිර්දේශ, නියමයන් හා කොන්දේසි

II. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ වෙනත් බලධාරියෙකු ආරෝපණය කරනු ලබන නීති/රෙගුලාසි ශ්‍රී ලංකාව තුළ කාලීනව පවත්නා නීතියයි.

31. සේවාදායක විසින් BOCC ට අයත් අන්තර්ජාල බැංකු වේදිකාව ගනුදෙනු සඳහා භාවිතා කරන විට සේවාදායක විසින් පිළිගත් ආරක්ෂක පටිපාටීන්ට අනුකූල විය යුතු අතර එම ''පටිපාටි'' නිර්මාණය කර ඇත්තේ ඔවුන් අතර සිදුවන සන්නිවේදන සත්‍යාපනය කිරීමටය. සේවාදායක විසින් එම සන්නිවේදන යැවීමට බලය පවරා ඇති පුද්ගලයන් කෙරෙහි විශ්වාසය තැබීමට BOCC ට හිමිකම් ඇති අතර සන්නිවේදන වන පුද්ගලයින්ගේ අනන්‍යතාව හෝ බලතල පටිපාටීන්ට අනුකූල දැයි සොයා බැලීමට අමතරව වෙනත් යමක් කිරීමට BOCC බැඳී නොමැත.

32. ලබාගන්නා සේවාවන් සඳහා සියළු බැංකු හා වෙනත් ගාස්තු හා වියහියදම් අයකර ගැනීමට හෝ ආරෝපණය කිරීමට BOCC ට හිමිකම් ඇති අතර එම මුදල් ණය ක්‍රමවලට අනුව සේවායෝජක ගිණුම් වලින් හර කරන අතර මෙම අයක්‍රම BOCC හි නිලවෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරඇත. අදාළ බැංකු ගාස්තු වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුව පවතින අතර එසේ කිරීමේ දී පූර්ව දැන්වීමක් අවශ්‍ය නොවේ.

33. BOCC හා BOCC සමූහයේ අනෙකුත් සාමාජිකයින්ගේ සේවාදායක තොරතුරු රැස්කිරීම, භාවිතය හා තමන් අතර බෙදාගන්නා මෙම තොරතුරු සමුදායට සේවාදායකයන්ගේ ගනුදෙනු සේවාදායකයන් අතර BOCC නිෂ්පාදන සේවා භාවිතය, සමූහය සමඟ ඇති සේවාදායක සම්බන්ධතා අයත් වේ. මේ සම්බන්ධයෙන් තොරතුරු සේවාදායකයන්ගෙන් ඉල්ලා සිටීම හෝ සේවාදායක වෙනුවෙන් පෙනීසිටින වෙනත් තැනැත්තෙකුගෙන් මෙවැනි තොරතුරු BOCC මාර්ගයෙන් හෝ සමූහයේ සාමාජිකයින් මඟින් හා වෙනත් මූලාශ්‍රයන්ගෙන් මෙවන් තොරතුරු සමූහයේ අනෙකුත් සාමාජිකයන් අතර පවත්නා තොරතුරු සම්බන්ධ කිරීමෙන් හා උත්පාදනය කිරීමෙන්

(''BOCC සමූහය'' යනු මෙම නියමයන් හා කොන්දේසි හි අරමුණු අනුව හඟවනු ලබන්නේ චීන බැංකුව හා සහනධාරී ශාඛාවන් වේ.)

34. BOCC හා/හෝ සමූහයේ සාමාජිකයන් විසින් සේවාදායක තොරතුරු පහත සඳහන් කාර්යයන් සඳහා සකස් කිරීමට, පැවරීමට හා හෙළි කිරීමට ලක්වනු ඇත.

I. සේවා සැපයීම හා සේවාදායකයන් විසින් ඉල්ලන හෝ බලාත්මක කරඇති ගනුදෙනු ඉටු කිරීම.

II. අනුකූලතා බැඳීම් ඉටුකිරීම.

III. මූල්‍ය අපරාධ අවධානම කළමනාකරණ ක්‍රියාකාරකම්

IV. සේවාදායකයන්ට අයවිය යුතු මුදල් ප්‍රවාහන එක්කාසු කිරීම.

V. ණයවර පරීක්ෂණ පැවැත්වීම හා ණයවර නිර්දේශ ලබාගැනීම.

VI. BOCC හෝ සමූහයේ සාමාජිකයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම හා බලාත්මක කිරීම.

VII. BOCC හි අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතාවන් හෝ සමූහයේ (සීමා රහිතව, ණයවර හා අවදානම කළමනාකරණ පද්ධති හෝ නිෂ්පාදන වර්ධන හා සැලසුම්, රක්ෂණ, විගණන හා පරිපාලන කටයුතු)

VIII. සේවාදායකයන් හා BOCC අතර සමස්ත සම්බන්ධතා පවත්වා ගැනීම (වාණිජ, මූල්‍යසේවා ප්‍රවර්ධනය හෝ අදාළ නිෂ්පාදන හා අලෙවි පර්යේෂණ)

35. සේවා භාවිතයෙන් සේවාදායකයින් එකඟවන්නේ BOCC විසින් (අවශ්‍ය හා යෝග්‍ය පරිදි ඉහත කී අරමුණු සඳහා) සේවාදායකට තොරතුරු හුවමාරු කරගැනීම හා හෙළිදරව් කිරීම් පහත සඳහන් ප්‍රතිලාභීන් අතර සිදු කෙරෙන විට එසේ සිදු කිරීමේ දී සේවාදායකයන් ගැන සඳහන් කිරීම් නොවනු ඇත. සේවාදායකයින් ද මෙවැනි සේවාදායක තොරතුරු සකස් කිරීම් හා හෙළිදරව් කිරීම් කරනු ඇත.

I. සමූහයේ ඕනෑම සාමාජිකයෙකු

II. උප කොන්ත්‍රාත්කරුවන්, ගෙවීම් ලබන්නන්, සමූහයේ හවුල්කරුවන් මෙන්ම සේවකයන්, අධ්‍යක්ෂකවරුන් හා නිලධාරීන්

III. සේවාදායකයන් වෙනුවෙන් පෙනී සිටින අයව, ගෙවුම් ලබන්නන්, ප්‍රතිලාභීන්, ගිණුම් නාමිකයන්, අතර මැදියන්, අනුරූප හා ඒජන්ත බැංකු, නිෂ්කාශන හෝ බේරුම් කිරීම් පද්ධති, වෙළඳපොල ප්‍රතිරූප, රැඳවූ ඒජන්තවරු, හුවමාරු හෝ වාණිජ සුරක්ෂිතාගාර, කොටස් වෙළඳපොල සේවාදායකයින් විසින් සුරැකුම් ගැන උනන්දුවක් ඇති සමාගම් (BOCC විසින් සේවාදායකයන් වෙනුවෙන් සුරැකුම්පත් ලබාඇත.)

IV. සේවාවන් ලබා ගැනීමට උනන්දුවක් ඇති හෝ බලාපොරොත්තු වන අවධානම් හෝ සේවාවන් සම්බන්ධයෙන් අවධානම් ගැනීමට

V. වෙනත් මූල්‍ය ආයතන, ණයවර යොමු කෙරෙන ඒජන්සි හෝ ණයවර තොරතුරු කාර්යාංශ, ව්‍යවස්ථාපිත අධිකාරිය, අධිකරණ, විගණකවරු හා බදු උපදේශකයන්

VI. තෙවැනි පාර්ශ්ව අරමුදල් කළමනාකරුවන්, සේවාදායකයන් වෙත වත්කම් කළමනාකරණ සේවා සපයන්නන්

VII. BOCC වෙත තැරැව්කරුවන් හඳුන්වාදීම්

VIII. BOCC ව්‍යාපාර හුවමාරු, බැහැර කිරීම්, ඒකාබද්ධ කිරීම් හෝ අත්පත් කරගැනීම්

IX. පවත්නා තැන අනුව සේවා සපයන්නන්

36. සේවාදායක වෙත සේවා සැපයීමේ දී සිදුවිය හැකි සියළු හිමිකම්පෑම්, ඉල්ලීම් ක්‍රියාකාරකම් හානි, වගකීම්, පිරිවැය, අලාභ, වියදම් හා ඉල්ලූවිට දියයුතු ගෙවීම් හා මෙවැනි වෙනත් ක්‍රියාදාමයන් සඳහා බැංකුව වන්දිපූර්ණය කරනු ඇත.

37. ස්වාභාවික හේතූන්මත සිදුවන අලාභ හානි, කැරළි කෝලාහල, යුද්ධවල සීමා නොවූ හා BOCC වගකීම් දූරිය නොහැකි සිද්ධීන් උදා-: වැඩවර්ජන හා මංකොල්ලකෑම්, ජන කැළඹීම්, දේශීය හා විදේශීය රාජ්‍ය වලින් කරන බලපෑම්, වෙළඳපොල කඩාකප්පම් කිරීම් හා එවැනි ක්‍රියාදාමයන් සඳහා BOCC වගකියනු නොලැබේ.

38. භාෂාවන් හි විෂමතාවන් ඇති විටෙක ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ලියවිලි පූර්වගාමීත්ව ගනු ඇත.

.....

අත්සන

නම .....

තනතුර .....

ජා.හැ.අ. .....

.....

අත්සන

නම .....

තනතුර .....

ජා.හැ.අ. .....